# 6 ශ්‍රී ලංකාවේ කර්මාන්ත කිහිපයක ව්‍යාප්තිය, ගැටලු හා ප්‍රවණතා


## ශ්‍රී ලංකාවේ කාර්මික ඉතිහාසය

ඈත අතීතයේ සිට ශ්‍රී ලංකාව කෘෂිකාර්මික රටක් ලෙස හඳුන්වනු ලැබුව ද කාර්මික ක්ෂේත්‍රයේ ද යම් දියුණුවක් තිබූ බව විවිධ ඓතිහාසික සාක්ෂි මගින් අනාවරණය වේ. විශේෂයෙන් ම පේෂ කර්මාන්තය, ඉදිකිරීම්, ලෝකුරු කර්මාන්තය, වාරි කර්මාන්තය, මූර්ති ශිල්පය, චිත්‍ර ශිල්පය වැනි අංශ ඉතා දියුණු මට්ටමක පැවතීමෙන් පැහැදිලි වන්නේ ඒ හා බැඳුණු සියුම් උපකරණ ද තාක්ෂණික ක්‍රමවේදයක් ද තිබූ බව යි. විශේෂයෙන් යපස් උණුකර ලෝහ සකස් කරගත් බවට සමනල වැව ආශ්‍රිත ව ද නෞකා තැනීමේ කර්මාන්තයක් මාන්තෙයි (මන්නාරම) ප්‍රදේශයේ ද තිබූ බවට ඓතිහාසික සාක්ෂි පවතී. මේ අනුව ශ්‍රී ලංකාවට ආවේණික කාර්මික දියුණුවක් අතීතයේ තිබූ බව හඳුනාගත හැකි ය. එසේ වුවද පසු කාලයක දී සිදු වූ විවිධ ආක්‍රමණ හා යුරෝපා යටත් විජිතකරණය හේතු කොටගෙන එම සාම්ප්‍රදායික කාර්මික දියුණුව අඩපණ විය.

බ්‍රිතාන්‍ය පාලන අවධියේ දී කාර්මික අමුද්‍රව්‍ය සකස් කිරීමේ හා පතල් කැණීම් වැනි නිෂ්කර්ෂක කර්මාන්තවල යම් වර්ධනයක් සිදු විය. නිදහස ලැබීමෙන් පසුව රාජ්‍ය ව්‍යවසායකත්වය යටතේ ලෝහ භාණ්ඩ, කඩදාසි, ටයර්, ටියුබ්, තුනී ලෑලි වැනි කර්මාන්ත රාශියක් ආරම්භ විය. එහෙත් එම කර්මාන්තවල ද අඛණ්ඩ වර්ධනයක් සිදු නොවී ය.

1977න් පසු ක්‍රියාත්මක වූ නිදහස් ආර්ථික ප්‍රතිපත්තිය අනුව, කාර්මික ක්ෂේත්‍රය තුළ පෞද්ගලික ව්‍යවසායකත්වය ප්‍රමුඛත්වයට පත්විය. ඒ අනුව වර්තමානය වන විට නිෂ්පාදන කර්මාන්ත විවිධ අංශ කරා ව්‍යාප්ත වෙමින් පවතී.

තෝරාගත් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ කර්මාන්ත කිහිපයක ව්‍යාප්තිය, ගැටලු හා ප්‍රවණතා පිළිබඳ ව අධ්‍යයනය කිරීම මෙම පරිච්ඡේදයේ අරමුණ වේ.




**6.1 ප්‍රස්තාරය**
**ශ්‍රී ලංකාවේ කර්මාන්තවල සංයුතිය**
**මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව 2012**

## තෝරාගත් කර්මාන්ත කිහිපයක්

- මිනිරන් කර්මාන්තය (Graphite Industry)
- පිඟන් මැටි ආශ්‍රිත කර්මාන්තය (Kaolin related Industry)
- විද්‍යුත් කර්මාන්තය (Electronic industry)
- පෙට්‍රෝ රසායන කර්මාන්තය (Petro-chemical Industry)
- මෝටර් රථ එකලස් කිරීම හා බෝට්ටු නිෂ්පාදනය (Automobile assembling and boat building Industry)
- ආහාර හා පාන වර්ග නිෂ්පාදන කර්මාන්ත (Food and beverages Production Industries)
- ගෘහ කර්මාන්ත (Cottage Industries)
- සංචාරක කර්මාන්තය (Tourism)




**6.1 රූපය**

**ශ්‍රී ලංකාවේ නිෂ්පාදන කර්මාන්ත ආශ්‍රිත භාණ්ඩ කිහිපයක්**

# මිනිරන් කර්මාන්තය

ශ්‍රී ලංකාවේ මිනිරන් කර්මාන්තයට වසර 160ක පමණ ඉතිහාසයක් ඇත. කාබන් ප්‍රතිශතය 97% - 99%ක් තරම් වූ ලෝකයේ උසස් ම වර්ගයේ මිනිරන්, ශ්‍රී ලංකාවෙන් හමු වේ. මේවා ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල විවිධ ප්‍රමාණයෙන් ව්‍යාප්ත ව ඇත. ප්‍රධාන වශයෙන් මධ්‍යම, වයඹ, සබරගමු, දකුණ හා උතුරුමැද පළාත්වල මිනිරන් දක්නට ලැබේ. මෙම මිනිරන්වලින් 97%ක් පමණ කාර්මික අමුද්‍රව්‍යයක් ලෙස අපනයනය කරන අතර දේශීය පරිභෝජනය සඳහා යොමු වන්නේ 3%ක් පමණ සුළු ප්‍රමාණයකි. මිනිරන් කර්මාන්තයේ ප්‍රධාන අංශ වන්නේ ඛනිජ කැණීම, ඒවා සකස් කිරීම, අපනයනය සහ දේශීය වශයෙන් මිනිරන් ආශ්‍රිත සුළු නිෂ්පාදන ප්‍රමාණයක් සිදුකිරීමත් ය.

ශ්‍රී ලංකාවෙන් ලබාගන්නා මිනිරන්, ධමනි මිනිරන් (Graphite) හා තලාතු මිනිරන් (Mica) වශයෙන් වර්ග දෙකකි.



6.2 රූපය
ධමනි මිනිරන්




6.3 රූපය
පතුරු ලෙස ඇති තලාතු මිනිරන් (Mica - මයිකා)

## මිනිරන් ව්‍යාප්ත ප්‍රදේශ

6.1 වගුව
මිනිරන් ව්‍යාප්ත ප්‍රදේශ

<table>
<tr><th>ඛනිජය</th><th>ව්‍යාප්ත ප්‍රදේශ</th><th>නිෂ්පාදිත ද්‍රව්‍ය</th></tr>
<tr><td rowspan="7">මිනිරන්<br>(ධමනි)</td><td>කහටගහ පතල</td><td rowspan="7">පැන්සල් කුරු<br>පොලිෂ්<br>තීන්ත වර්ග<br>ස්නේහක ද්‍රව්‍ය (ලිහිසි ද්‍රව්‍ය)<br>වියළිකෝෂ අමුද්‍රව්‍ය<br>අච්චු (කෝව) නිෂ්පාදන</td></tr>
<tr><td>කොලොන්ගහ පතල</td></tr>
<tr><td>බෝගල පතල</td></tr>
<tr><td>රංගල</td></tr>
<tr><td>සියඹලාපිටිය</td></tr>
<tr><td>බෝතලේ</td></tr>
<tr><td>රා ගෙදර</td></tr>
<tr><td rowspan="5">මයිකා<br>(තලාතු මිනිරන්)</td><td>තලාගොඩ, මඩුමාන</td><td rowspan="5">විද්‍යුත් පරිවාරක<br>විදුලි උපකරණ<br>තීන්ත වර්ග<br>විවිධ ප්ලාස්ටික් නිෂ්පාදන<br>බොයිලේරු ආවරණ<br>රබර් නිෂ්පාදන සඳහා</td></tr>
<tr><td>පල්ලෙකැලේ, තලාතුඔය</td></tr>
<tr><td>මයිලපිටිය, පින්නවල</td></tr>
<tr><td>බදුල්ල, දුටුවැව</td></tr>
<tr><td>ගොඩකවෙල</td></tr>
</table>

2008 සිට 2011 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ මිනිරන් නිෂ්පාදන ප්‍රමාණය 6.2 වගුවෙන් දැක්වේ. 2011 වර්ෂය වන විට ධමනි මිනිරන් නිෂ්පාදන ප්‍රමාණය ක්‍රමයෙන් අඩු වී ඇති බව එයින් හඳුනාගත හැකි ය.

**6.2 වගුව**

**ධමනි මිනිරන් හා මයිකා නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්)**

| වර්ෂය | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|
| මිනිරන් | 6615 | 3 171 | 3 437 | 3 357 |
| මයිකා | 2364 | 2 347 | 2 095 | 2 927 |

මූලාශ්‍රය - Sri Lanka Minerals Yearbook, 2012

2009 සිට 2011 දක්වා කාලය තුළ ශ්‍රී ලංකා මිනිරන් අපනයනය කළ ප්‍රධාන රටවල්, ප්‍රමාණය සහ ආදායම 6.3 සහ 6.4 වගුවලින් දැක්වේ. ඒ අනුව අදාළ කාලසීමාව තුළ විවිධ රටවලට මිනිරන් අපනයනය කිරීමෙන් ශ්‍රී ලංකාවට ලැබුණු ආදායම මෙන් ම අපනයනය කරන ලද ප්‍රමාණයෙහි ද වෙනස්කම් සිදු වී ඇති බව හඳුනාගත හැකි ය. ජපානය, ඇමරිකා එක්සත් ජනපදය හා චීනය ශ්‍රී ලංකාවේ මිනිරන් වැඩි ම ප්‍රමාණයක් මිල දී ගන්නා රටවල් ලෙස දැක්විය හැකි ය.

**6.3 වගුව**

**ශ්‍රී ලංකාවේ මිනිරන් (ධමනි මිනිරන්) අපනයනය**

| රට | 2009 | | 2010 | | 2011 | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) | ආදායම (ඇමරිකන් ඩොලර්) | ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) | ආදායම (ඇමරිකන් ඩොලර්) | ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) | ආදායම (ඇමරිකන් ඩොලර්) |
| ජපානය | 700 | 456 526 | 920 | 616 565 | 1538 | 1 457 889 |
| ඇමරිකා එක්සත් ජනපදය | 164 | 213 174 | 642 | 1 102 636 | 658 | 1 122 265 |
| පාකිස්තානය | 1560 | 710 214 | 310 | 177 442 | 400 | 376 802 |
| ජර්මනිය | 20 | 26 394 | 803 | 1 299 307 | 527 | 550 187 |
| එක්සත් රාජධානිය | 434 | 615 275 | 149 | 226 216 | 115 | 200 939 |
| ඉන්දියාව | 142 | 135 836 | 135 | 190 579 | 61 | 111 893 |

මූලාශ්‍රය - Sri Lanka Minerals Year book, 2012

ශ්‍රී ලංකාවේ මයිකා අපනයනය කරන රටවල් 6.4 වගුවෙන් දැක්වේ.

**6.4 වගුව**

**ශ්‍රී ලංකාව, තලාතු මිනිරන් (මයිකා) අපනයනය කරන ලද රටවල්**

| රට | 2009 | | 2010 | | 2011 | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) | ආදයම (ඇමරිකන් ඩොලර්) | ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) | ආදයම (ඇමරිකන් ඩොලර්) | ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) | ආදයම (ඇමරිකන් ඩොලර්) |
| චීනය | 991 | 378 082 | 1456 | 556 354 | 1002 | 371 609 |
| ජර්මනිය | - | - | 100 | 46 887 | 80 | 28 816 |
| ඉන්දියාව | 168 | 30 926 | 57 | 22 424 | 563 | 192 994 |
| දකුණු කොරියාව | - | - | - | - | 20 | 8500 |

මූලාශ්‍රය - Sri Lanka Minerals Year book, 2012

## මිනිරන් කර්මාන්තයේ පවතින ගැටලු

- මිනිරන් කැණීම් සඳහා අධික වියදම් දැරීමට සිදු වීම.
- සේවක ගැටලු (වැටුප්/සෞඛ්‍යමය/තාක්ෂණ/අවදානම)
- කැණීම්වල දී පරිසරයට හානි සිදු වීම.
- ශ්‍රී ලංකාවේ සැලකිය යුතු මිනිරන් ව්‍යාප්තියක් ඇතත් වර්තමානය වන විට කැණීම් කටයුතු පතල් දෙකකට පමණක් සීමා වීම.
- නිෂ්පාදන ප්‍රමාණය ක්‍රමික ව පහළ යාම. නිදසුන් : 2008 වර්ෂයේ ධමනි මිනිරන් මෙට්‍රික් ටොන් 6615ක් නිෂ්පාදනය කළ ද 2011 වර්ෂය වන විට මෙට්‍රික් ටොන් 3357ක් දක්වා එම ප්‍රමාණය අඩු වී යාම.
- මෙම වටිනා සම්පත දේශීය කාර්මික අමුද්‍රව්‍යයක් ලෙස භාවිතයට ගැනීම ඉතා අවම මට්ටමක පැවතීම.

## ප්‍රවණතා

- රාජ්‍ය අංශය යටතේ පැවති මිනිරන් කර්මාන්තය වර්තමානය වන විට පෞද්ගලික අංශය මගින් පවත්වාගෙන යාම.
- පතල් කැණීම් සඳහා නව තාක්ෂණික ශිල්පීය ක්‍රම භාවිතයට ගැනීම.
- එමගින් ශ්‍රමිකයන්ට ඇති අවදානම අවම කිරීමට පියවර ගැනීම.
- යුරෝපා ගැනුම්කරුවන්ට අතිරේක ව ආසියානු රටවල් ද නව ගැනුම්කරුවන් බවට පත්වීම.

**ක්‍රියාකාරකම්**

1. ශ්‍රී ලංකාවේ ධමනි මිනිරන් හා මයිකා ඛනිජය ව්‍යාප්ත ව ඇති ප්‍රදේශ සහ ඒවා අයත් දිස්ත්‍රික්ක ඇතුළත් වගු දෙකක් වෙන වෙන ම සකස් කරන්න.
2. ශ්‍රී ලංකාවේ ආකෘති සිතියමක ප්‍රධාන මිනිරන් පතල් තුනක් සහ මිනිරන් ව්‍යාප්ත ප්‍රදේශ තුනක් ලකුණු කර නම් කරන්න.
3. 6.3 සහ 6.4 වගු ඇසුරින් ශ්‍රී ලංකාවේ ධමනි මිනිරන් සහ මයිකා අපනයනය පිළිබඳ කැපී පෙනෙන ලක්ෂණ කිහිපයක් වෙන් වශයෙන් සඳහන් කරන්න.
4. 2011 වර්ෂයේ දී ශ්‍රී ලංකාව වැඩි ම මිනිරන් ප්‍රමාණයක් අපනයනය කරන ලද රටවල් තුනක් අනුපිළිවෙළින් නම් කර ඒවා ලෝක ආකෘති සිතියමක ලකුණු කරන්න.

## පිඟන් මැටි ආශ්‍රිත කර්මාන්තය

ශ්‍රී ලංකාවේ පිඟන් මැටි ආශ්‍රිත කර්මාන්තය සඳහා ප්‍රධාන අමුද්‍රව්‍ය වශයෙන් භාවිත කරන මැටි වර්ග දෙකකි. ඒ කෙඕලින් (kaolin) හෙවත් කිරිමැටි සහ බෝල මැටි (Feldspar) ය. කෙඕලින් උසස් තත්ත්වයේ පිඟන් භාණ්ඩ නිෂ්පාදනයට ද, බෝල මැටි විශේෂයෙන් පිඟන් ගඩොල් නිෂ්පාදනයට සහ පිඟන් භාණ්ඩ නිෂ්පාදනයට ද යොදා ගැනේ.

පිඟන් මැටි ආශ්‍රිත නිෂ්පාදන සඳහා මැටිවලට අමතර ව ෆෙල්ස්පාර් (Feldspar), සිලිකා (silica), ක්වාට්ස් (quartz) හා කැල්සයිට් (calcite) යන ඛනිජ ද අමුද්‍රව්‍ය ලෙස භාවිත කෙරේ. මෙම සියලු අමුද්‍රව්‍ය දේශීය ව ලබාගැනීමට හැකි වීම මෙම කර්මාන්තයේ දියුණුවට හේතු වී ඇත. පිඟන් මැටි නිධි බොහෝ විට තෙත් කලාපයේ පහත් බිම්වල ව්‍යාප්ත ව ඇති අතර මාතලේ, රත්තොට ප්‍රදේශයේ ද කෙඕලින් නිධියක් පිහිටා ඇත. මැටි ලබාගැනීමේ පහසුව මත මෙම කර්මාන්ත, මැටි නිධි පිහිටි ප්‍රදේශවල ම ස්ථානගත වී තිබේ.

**6.5 වගුව**

**පිඟන් මැටි නිධි පිහිටි ප්‍රදේශ, කර්මාන්ත පිහිටි ප්‍රදේශ සහ නිෂ්පාදන භාණ්ඩ**

| පිඟන් මැටි නිධි පිහිටි ප්‍රදේශ | කර්මාන්ත පිහිටි ප්‍රදේශ | පිඟන් මැටි ආශ්‍රිත නිෂ්පාදන (**Ceramic ware**) |
|---|---|---|
| **කෙඕලින්**<br>බොරලැස්ගමුව,<br>මීටියාගොඩ,<br>රත්තොට<br>**බෝල මැටි**<br>දෙදියවල | දන්කොටුව<br>මීගමුව<br>පිළියන්දල<br>මීපේ<br>හොරණ<br>රත්තොට | • පිඟන් භාණ්ඩ (Ceramic Ware)<br>• පිඟන් ගඩොල් (Tiles)<br>• විසිතුරු භාණ්ඩ (Ornaments)<br>• සනීපාරක්ෂක කට්ටල (Sanitaryware)<br>මීට අමතර ව තීන්ත වර්ග/ රබර් නිෂ්පාදන/දත් බෙහෙත්/කඩදසි වැනි නිෂ්පාදන සඳහා ද පිඟන් මැටි අමුද්‍රව්‍ය ලෙස භාවිත කෙරේ. |



6.4 රූපය
පිඟන් මැටි ආශ්‍රිත නිෂ්පාදන භාණ්ඩ


6.6 වගුව
පිඟන් මැටි ආශ්‍රිත නිෂ්පාදන භාණ්ඩ, නිෂ්පාදන ප්‍රමාණය සහ ලැබූ ආදායම (2009-2011)

| | 2009 | 2010 | 2011 |
|---|---|---|---|
| විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්) | 91 | 180 | 3819 |
| ලැබූ ආදායම (රුපියල් මිලියන) | | | |
| - දේශීය අලෙවියෙන් | - | 6.45 | 485.7 |
| - අපනයනයෙන් | 78.57 | 237.23 | 1837.7 |
| පිඟන් භාණ්ඩ නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්) | 7050 | 6700 | 2674 |
| ලැබූ ආදායම (රුපියල් මිලියන) | | | |
| - දේශීය අලෙවියෙන් | 615.11 | 721.11 | 465.5 |
| - අපනයනයෙන් | 2976.69 | 2689.05 | 834.8 |
| පිඟන් ගඩොල් නිෂ්පාදනය (වර්ග මීටර්) | 9 059 618 | 8 075 739 | 9 822 603 |
| ලැබූ ආදායම (රුපියල් මිලියන) | | | |
| - දේශීය අලෙවියෙන් | 8576.0 | 8863.5 | 11421.0 |
| - අපනයනයෙන් | 944.7 | 637.3 | 632.8 |
| සනීපාරක්ෂක කට්ටල නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්) | 1650 | 1966 | 3600 |
| ලැබූ ආදායම (රුපියල් මිලියන) | | | |
| - දේශීය අලෙවියෙන් | 140 | 321 | 873 |
| - අපනයනයෙන් | - | 0.32 | 8.0 |

මූලාශ්‍රය - Sri Lanka Minerals Year book, 2012

පිඟන් මැටි ආශ්‍රිත නිෂ්පාදන භාණ්ඩ, නිෂ්පාදන ප්‍රමාණය හා ලැබූ ආදයම 6.6 වගුවෙන් දක්වේ. විසිතුරු භාණ්ඩ අපනයනය මගින් වැඩි ආදායමක් උපයාගෙන ඇති අතර පිඟන් ගඩොල් හා සනීපාරක්ෂක කට්ටල සඳහා දේශීය අලෙවියෙන් වැඩි ආදායමක් උපයාගෙන ඇති බව එම වගුවෙන් පැහැදිලි වේ.

## ශ්‍රී ලංකාවේ ඛනිජ කිහිපයක ව්‍යාප්තිය




**6.1 සිතියම**
**ශ්‍රී ලංකාවේ ඛනිජ කිහිපයක ව්‍යාප්තිය**

**මූලාශ්‍රය - භූ විද්‍යා පතල් කාර්යාංශය වාර්ෂික වාර්තාව - 2012, ඇසුරින් සකස් කරන ලදි.**

## ගැටලු

- මැටි නිධි ක්ෂයවෙමින් පැවතීම.
- මැටි පිරිසිදු කිරීම හා සකස් කර ගැනීමට විශාල පිරිවැයක් දැරීමට සිදු වීම.
- කැණීම් ආශ්‍රිත ව සිදු වන පරිසර දූෂණය
- භාණ්ඩ නිෂ්පාදන පිරිවැය ඉහළ යාම. (සේවක වැටුප්/බලශක්තිය සඳහා වියදම)
- භාණ්ඩ මිල අධික වීම.
- ආනයනික භාණ්ඩ සමග වෙළෙඳපොළ තරගය
- රාජ්‍ය ප්‍රතිපත්ති

## ප්‍රවණතා

- මුළුමනින් ම පෞද්ගලික අංශයට නැඹුරු වූ කර්මාන්තයක් වීම.
- ඉහළ තාක්ෂණයක් හා පුහුණු ශ්‍රමිකයන් යොදගැනීම මත ගුණාත්මක භාණ්ඩ නිෂ්පාදනය වීම.
- දේශීය මෙන් ම විදේශීය වශයෙන් ද උසස් පිළිගැනීමක් මෙම භාණ්ඩ සඳහා ලැබීම.
- සංවර්ධිත රටවලින් වැඩි ඉල්ලුමක් ඇති වීම. (ඇමරිකා එක්සත් ජනපදය/ජපානය/කැනඩාව/ඕස්ට්‍රේලියාව/යුරෝපා වෙළෙඳපොළ)
- පිඟන් මැටි ආශ්‍රිත විසිතුරු භාණ්ඩ සඳහා ඉහළ විදේශ ඉල්ලුමක් වර්ධනය වීම.
- පිඟන් ගඩොල්, සනීපාරක්ෂක කට්ටල සඳහා දේශීය ඉල්ලුම ක්‍රමික ව ඉහළ යාම.
- ප්‍රමාණයෙන් විශාල හා ගුණාත්මක පිඟන් ගඩොල් නිෂ්පාදනය පුළුල් වීම.

### ක්‍රියාකාරකම්

1. පිඟන් මැටි නිධි පිහිටි ප්‍රදේශ හා එම කර්මාන්තශාලා පිහිටි ප්‍රදේශ ශ්‍රී ලංකා දිස්ත්‍රික් සිතියමක ලකුණු කර නම් කරන්න.
2. 6.6 වගුව අධ්‍යයනය කොට පිඟන් මැටි ආශ්‍රිත භාණ්ඩවල නිෂ්පාදන ප්‍රමාණය හා ඒවා අලෙවියෙන් ලබාගත් ආදයම යන අංශවල කාලීන ව සිදු වී ඇති වෙනස්කම් පැහැදිලි කරන්න.

### පැවරුම

ඔබ නිවසේ ඇති පහත දැක්වෙන ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත භාණ්ඩ හඳුනාගෙන ඒවායේ වෙළෙඳනාම, භාණ්ඩය හා ගළපා ලේඛනයක් සකස් කරන්න.

- විසිතුරු භාණ්ඩ (පිඟන් මැටි ආශ්‍රිත)
- පිඟන් භාණ්ඩ
- පිඟන් ගඩොල්
- සනීපාරක්ෂක කට්ටල

# විද්‍යුත් කර්මාන්තය

ලෝකයේ විද්‍යුත් කර්මාන්තය මෑතක දී ආරම්භ වුවද කෙටි කාලයක් ඇතුළත විශාල ආදායම් ලබන කර්මාන්තයක් බවට පත් වී තිබේ. ශ්‍රී ලංකාවේ ද විද්‍යුත් කර්මාන්තය ආරම්භ වූයේ ඉතාමත් මෑතක දී ය. අධිතාක්ෂණික කර්මාන්ත (High-tech industries) යටතට ගැනෙන මෙම කර්මාන්තය නව තාක්ෂණික සොයාගැනීම් සමග වේගයෙන් වර්ධනය වන හා වෙනස් වන නිෂ්පාදනවලින් යුක්ත ය.

## විද්‍යුත් උපකරණ

- ගුවන්විදුලි යන්ත්‍ර (Radio sets)
- රූපවාහිනි (Television)
- පරිගණක (Computers)
- විද්‍යුත් පරිපථ (Electronic circuits)
- දුරස්ථ පාලක (Remote control equipment)
- සංඥා උපකරණ (Signal equipment)
- විද්‍යුත් සන්නායක (Electronic sensors)



6.5 රූපය
විද්‍යුත් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන

විද්‍යුත් කාර්මික නිෂ්පාදන විදුලි උපකරණවලින් වෙනස් වන්නේ විද්‍යුත් නිෂ්පාදන අධිතාක්ෂණික උපාංගවීමත්, රැහැන් රහිතවීමත් (wireless) විද්‍යුතයෙන් ක්‍රියාකරන තාක්ෂණයක් මෙම භාණ්ඩවලට හිමිවීමත් නිසා ය. බොහෝ විට ඇතැම් විදුලි උපකරණ තුළ ද විද්‍යුත් උපාංග දැකිය හැකි ය.

විද්‍යුත් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන සඳහා දේශීය ඉල්ලුම ඉහළ යාම නිසා ද මෙම කර්මාන්තය දියුණු වෙමින් පවතී. විශේෂයෙන් එකලස් කිරීමේ කර්මාන්තයක් වශයෙන් පවතින විද්‍යුත් කර්මාන්තය ආශ්‍රිත ඇතැම් නිෂ්පාදන, විදේශ වෙළෙඳපොළට ද අපනයනය කෙරේ. 2009 වර්ෂයේ විද්‍යුත් නිෂ්පාදන අපනයන කිරීමෙන් ඇමරිකන් ඩොලර් මිලියන 187.51ක් උපයා ගෙන ඇති අතර 2011 වන විට එම ආදයම ඇමරිකන් ඩොලර් මිලියන 312.61 දක්වා වැඩි වී තිබේ.

## ව්‍යාප්තිය

විද්‍යුත් උපකරණ නිපදවීමේ කර්මාන්ත බොහෝ විට මධ්‍ය පරිමාණයේ කර්මාන්ත වන අතර කොළඹ හා තදාසන්න ප්‍රදේශවල ද, ආයෝජන ප්‍රවර්ධන කලාප (Investment Promotion Zone) ආශ්‍රිත ව ද ව්‍යාප්ත ව ඇත.

### ගැටලු

- මෙම විද්‍යුත් නිෂ්පාදන බොහෝ විට ආනයන උපාංග මත රඳා පැවතීම.
- තාක්ෂණය වේගයෙන් වෙනස් වීම නිසා විද්‍යුත් උපකරණ විශාල ප්‍රමාණයක් කෙටි කාලයක දී යල්පැන ගිය භාණ්ඩ බවට පත්වීම.
- යල්පැන ගිය විද්‍යුත් උපකරණ පරිසරයට මුදා හැරීම නිසා පරිසර හානියක් සිදු වීම.
- ජංගම දුරකථන වැනි විද්‍යුත් උපකරණ නිරන්තර භාවිතයෙන් සෞඛ්‍යමය ගැටලු ඇති විය හැකි වීම.
- සංස්කෘතික ගැටලු ඇති වීම.

### ප්‍රවණතා

- විශාල වශයෙන් විද්‍යුත් නිෂ්පාදන ආශ්‍රිත සෘජු හා වක්‍ර රැකියා අවස්ථා බිහි වීම.
- අවශ්‍ය විශේෂඥ ශ්‍රමිකයන් බිහි කරන උසස් අධ්‍යාපන ආයතන හා පාසල් විෂයමාලා සකස් වීම.
- විද්‍යුත් උපකරණ අලුත්වැඩියා හා සේවා මධ්‍යස්ථාන බහුල ව ව්‍යාප්ත වීම.
- ආනයනික විද්‍යුත් උපකරණවල ගුණාත්මක තත්ත්වය හා තාක්ෂණය දේශීය නිෂ්පාදනවලට ද එකතු වීම.
- එකලස් කිරීමේ කර්මාන්ත බොහෝ විට නාගරික ප්‍රදේශවල ස්ථානගත වීම.

**ක්‍රියාකාරකම්**

1. ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත, විද්‍යුත් උපකරණ කිහිපයක් හඳුනාගෙන ඒවායේ වෙළෙඳ නාමය (brand names) සමඟ නම් කරන්න.
2. විද්‍යුත් උපකරණ පරිහරණයේ ඇති වාසි හා අවාසි සාකච්ඡා කර වාර්තාවක් සකස් කරන්න.

## පෙට්‍රෝ රසායන කර්මාන්තය

පෙට්‍රෝලියම් පිරිපහදුවේ දී ප්‍රධාන වශයෙන් පැට්‍රල්, ඩීසල්, භූමිතෙල් යන ද්‍රව ඉන්ධන හා ගෑස් ලබා ගැනීමෙන් අනතුරු ව ඉතිරි වන ද්‍රව්‍ය ඇසුරෙන් කෙරෙන නිෂ්පාදන කර්මාන්ත, පෙට්‍රෝ රසායන කර්මාන්ත ලෙස හැඳින්වේ.

ශ්‍රී ලංකාවේ ඛනිජතෙල් අවශ්‍යතාවෙන් වැඩි කොටසක් සපුරා ගන්නේ ආනයනික බොරතෙල් පිරිපහදුවෙන් (crude oil refinery) නිසා මෙම කර්මාන්තයට අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා ගැනීම, බොරතෙල් පිරිපහදුවේ ප්‍රමාණය මත රඳා පවතී. එමෙන් ම එම අමුද්‍රව්‍ය ප්‍රමාණය මත එම කර්මාන්තයේ තරම තීරණය වේ. විශේෂයෙන් මෙම කර්මාන්තය නව තාක්ෂණික ක්‍රම ශිල්ප හා යන්ත්‍රසූත්‍ර බහුල ව භාවිත කරනු ලබන ප්‍රාග්ධන සූක්ෂම කර්මාන්තයකි.

2012 වර්ෂයේ ශ්‍රී ලංකාවේ කාර්මික භාණ්ඩ අපනයන සංයුතිය අනුව ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන, එම සංයුතියෙන් 5%ක් අත්පත් කරගෙන ඇති අතර එමගින් ලැබූ ආදයම ඇමරිකන් ඩොලර් මිලියන 463ක් විය. 6.2 ප්‍රස්තාරය බලන්න. (ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව 2012) එමෙන් ම මෙම කාර්මික නිෂ්පාදන රාශියක් දේශීය වෙළෙඳපොළට ද නිකුත් කෙරේ. මේ අනුව කාර්මික ක්ෂේත්‍රයේ වැදගත් ස්ථානයක් පෙට්‍රෝ රසායන කර්මාන්තයට හිමි වන බව පැහැදිලි වේ.

### ව්‍යාප්තිය

ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් පිරිපහදු කිරීමේ කර්මාන්තශාලාව කැලණියට ආසන්න සපුගස්කන්ද ප්‍රදේශයේ පිහිටා ඇත. එබැවින් අමුද්‍රව්‍ය ලබාගැනීමේ පහසුව මත පෙට්‍රෝ රසායන කර්මාන්තශාලා ද බොහෝ විට කොළඹට ආසන්න ප්‍රදේශවල මෙන් ම ආයෝජන ප්‍රවර්ධන කලාපවල ද ව්‍යාප්ත ව පවතී.

### පෙට්‍රෝ රසායන කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන

- ප්ලාස්ටික් (Plastics)
- කෘමිනාශක (Insecticide)
- රසායනික පොහොර (Chemical fertilizer)
- ඖෂධ වර්ග (Drugs)
- ලිහිසි තෙල් (Lubricants)
- සුවඳවිලවුන් (Perfumes)
- පැරපින් ඉටි (Paraffin wax)
- රූපලාවන්‍ය ආලේපන (Beauty products)
- තීන්ත වර්ග (Paints)
- කෘත්‍රිම රබර් (Synthetic rubber)
- වෙනත් ද්‍රාවක (Other liquid products)




**6.6 රූපය**
**පෙට්‍රෝ රසායන කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන භාණ්ඩ**

### ගැටලු

- ආනයනික තෙල් පිරිපහදුවේ ප්‍රමාණය මත, අමුද්‍රව්‍ය ප්‍රමාණය තීරණය වීම.
- ඛනිජ තෙල් මිල උච්චාවචනය නිසා නිෂ්පාදන කර්මාන්තය කෙරෙහි අහිතකර ලෙස බලපෑම.
- නිෂ්පාදන වියදම වැඩි වීම නිසා භාණ්ඩ මිල ඉහළ යාම.
- ප්‍රාග්ධන සූක්ෂම කර්මාන්තයක් බැවින් ප්‍රාග්ධන හිඟය බලපෑම.
- ආනයනික භාණ්ඩ සමඟ ඇති වෙළෙඳපොළ තරගය
- කර්මාන්තයේ දී ඉවත් වන අපද්‍රව්‍ය මෙන් ම භාවිතයෙන් පසු භාණ්ඩ ඉවත දැමීම නිසා සිදුවන පරිසර දූෂණය

**ප්‍රවණතා**

- ආර්ථික දියුණුවත් සමඟ පෙට්‍රෝ රසායන නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම ඉහළ යාම.
- මෙම කර්මාන්තය ආශ්‍රිත ව නිෂ්පාදන ප්‍රමාණය හා ආදායම් ඉහළ යාම.
- මෙම කර්මාන්ත නාගරික ප්‍රදේශවල ම ස්ථානගත වීම.
- නිෂ්පාදිත භාණ්ඩ සඳහා දේශීය වෙළෙඳපොළ පුළුල් වීම සහ වෙළෙඳපොළ තරගය වැඩි වීම.
- නිෂ්පාදිත භාණ්ඩවල විවිධාංගීකරණයක් දක්නට ලැබීම. නිදසුන් - ලිහිසි තෙල් වර්ග, විවිධ ප්ලාස්ටික් භාණ්ඩ, වැනි නිෂ්පාදන

**ක්‍රියාකාරකම්**

1. ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් පිරිපහදු කර්මාන්තශාලාව පිහිටි ස්ථානය ශ්‍රී ලංකා දිස්ත්‍රික්ක සිතියමක ලකුණුකර නම් කරන්න.
2. අප පරිහරණය කරන පෙට්‍රෝලියම් අඩංගු ද්‍රාවක කිහිපයක් නම් කරන්න.
3. පෙට්‍රෝ රසායන කර්මාන්තය දියුණු කිරීමේ වාසි අවාසි පැහැදිලි කරන්න.

**පැවරුම**

ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත පෙට්‍රෝ රසායන නිෂ්පාදන ඇතුළත් ලේඛනයක් සකස් කරන්න.

## මෝටර් රථ එකලස් කිරීම හා බෝට්ටු නිෂ්පාදනය

### මෝටර් රථ

මෑතකාලීන ව ආරම්භ වූ මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තය, ශ්‍රී ලංකාවේ කර්මාන්ත අතර වර්ධනීය ලක්ෂණ පෙන්නුම් කරන කර්මාන්තයකි. දේශීය වෙළෙඳපොළේ මෝටර් රථ සඳහා ඇති ඉහළ ඉල්ලුමත් ආනයනික වාහනවල ඉහළ මිලත් සැලකිල්ලට ගනිමින් දේශීය මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තය ආරම්භ විය. මීට දශක හතරකට පමණ පෙර ආනයනික මෝටර් රථ කොටස් එකලස් කිරීමෙන් උපාලි ෆියට් (Upali Fiat) හා මැස්ඩා (Mazda) යන මෝටර් රථ නිෂ්පාදනයට යොමු වූවත් එය අඛණ්ඩ ව පවත්වාගෙන යාමට නොහැකි වීය.

2001 වර්ෂයේ දී ආරම්භ කරන ලද මයික්‍රෝ (Micro) මෝටර් රථ කර්මාන්තය ද ආනයනික මෝටර් රථ කොටස් එකලස් කිරීමේ කර්මාන්තයක් ලෙස ආරම්භ වූවකි. මයික්‍රෝ වාහන එකලස් කිරීමේ ප්‍රධාන කර්මාන්තශාලාව පොල්ගහවෙල ප්‍රදේශයේ පිහිටා ඇත.




**6.7 රූපය**
**කොටස් එකලස් කිරීමෙන් නිෂ්පාදනය කරන ලද මෝටර් රථ**

### ගැටලු

- ඉහළ තාක්ෂණික ශිල්ප ක්‍රමවලින් යුක්ත විශාල කර්මාන්තශාලා නොතිබීම.
- ආනයනික මෝටර් රථ සමග ඇති වෙළෙඳපොළ තරගය
- තාක්ෂණය පිළිබඳ ගැටලු
- ප්‍රාග්ධන හිඟය
- ප්‍රධාන කර්මාන්තයක් ලෙස ව්‍යාප්ත නොවීම

### ප්‍රවණතා

- විවිධ මාදිලියේ මෝටර් රථ එකලස් කිරීම.
- මෙම නිෂ්පාදන කර්මාන්තය සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබීම.
- නව තාක්ෂණික ශිල්ප ක්‍රම හා විවිධ උපාංග ක්‍රමික ව මෝටර් රථවලට එකතු කිරීම.
- මෝටර් රථවල ගුණාත්මක තත්ත්වය ක්‍රමයෙන් වැඩි දියුණු වීම.
- එකලස් කිරීමේ කර්මාන්තයක් ලෙස දේශීය කර්මාන්ත ක්ෂේත්‍රය තුළ ශක්තිමත් වීම.

## බෝට්ටු නිෂ්පාදනය

ශ්‍රී ලංකාවේ සංචාරක අංශයේ සිදු වූ වර්ධනයත්, ධීවර කටයුතු පුළුල් වීමත් සමග ම කුඩා හා මධ්‍ය ප්‍රමාණයේ බෝට්ටු සඳහා දේශීය වශයෙන් ඉල්ලුම වැඩි විය. දැව බෝට්ටු නිෂ්පාදනය පිළිබඳ පාරම්පරික අත්දැකීම් නිසා උසස් වර්ගයේ බෝට්ටු නිෂ්පාදනය කිරීමට ශ්‍රී ලංකාවට හැකි වී තිබේ. එබැවින් ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත බෝට්ටු සඳහා විදේශ ඉල්ලුම ද වර්ධනය වෙමින් පවතී. පෞද්ගලික ව්‍යවසායකයන් රාශියක් දේශීය මෙන් ම විදේශ වෙළෙඳපොළ සඳහා ද බෝට්ටු නිෂ්පාදනය කරනු ලැබේ. ඉන්දියාව, මාලදිවයින, සිංගප්පූරුව, නෝර්වේ, දකුණු කොරියාව, සීසෙල්ස් දූපත් වැනි රටවලට ශ්‍රී ලංකාව බෝට්ටු අපනයනය කරනු ලැබේ. එමගින් 2006 වර්ෂයේ දී උපයාගත් ආදායම ඇමරිකන් ඩොලර් මිලියන 7.64ක් වූ අතර 2010 වන විට එය ඇමරිකන් ඩොලර් මිලියන 97 දක්වා වැඩි වී තිබේ. (මූලාශ්‍රය - www.Srilankaexpo.com)

## නිෂ්පාදනය කරනු ලබන බෝට්ටු වර්ග

- ධීවර බෝට්ටු (Fisheries boats)
- මගී බෝට්ටු (Passenger boats)
- සංචාරක බෝට්ටු (Tourist boats)
- ආරක්ෂක බෝට්ටු (Defense craft)
- ක්‍රීඩා හා විනෝද කටයුතු සඳහා බෝට්ටු (Boats for sports and leisure)
- අධිවේගී බෝට්ටු (Fast craft)

### ව්‍යාප්තිය

බෝට්ටු නිෂ්පාදන ආයතන රාශියක් නාගරික වෙරළාසන්න ප්‍රදේශවල ව්‍යාප්ත වී ඇති බව පෙනේ.

| | | |
|---|---|---|
| ප්‍රදේශ - බේරුවල | මට්ටක්කුලිය | පානදුර |
| කළුතර | පයාගල | මිරිස්ස |
| මීගමුව | ත්‍රිකුණාමලය | කොරලවැල්ල |
| යාපනය | | |



6.8 රූපය
විවිධ මාදිලියේ බෝට්ටු

### ගැටලු

- අමුද්‍රව්‍ය, බලශක්තිය හා වෙනත් යෙදවුම් සඳහා පිරිවැය ඉහළ යාම.
- බෝට්ටු නිෂ්පාදනයට අවශ්‍ය යාන්ත්‍රික කොටස් හා තාක්ෂණික මෙවලම් ආනයනය සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදු වීම.

### ප්‍රවණතා

- ශ්‍රී ලංකාවේ බෝට්ටුවලට ඇති ඉල්ලුම ක්‍රමික ව ඉහළ යාම.
- තාක්ෂණික උපකරණවලින් යුත් ගුණාත්මක බෝට්ටු නිෂ්පාදනයට යොමු වීම.
- විවිධ අවශ්‍යතා සඳහා විවිධ මාදිලියේ බෝට්ටු නිපදවීම.

**ක්‍රියාකාරකම්**

1. ශ්‍රී ලංකාවේ බෝට්ටු නිෂ්පාදන ආයතන පිහිටි ප්‍රදේශ ශ්‍රී ලංකා ආකෘති සිතියමක ලකුණු කර නම් කරන්න.
2. ශ්‍රී ලංකාවේ බෝට්ටු නිෂ්පාදනය පිළිබඳ ප්‍රවණතා ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට බලපාන ආකාරය පැහැදිලි කරන්න.

**පැවරුම**

ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත විවිධ මාදිලියේ බෝට්ටුවල පින්තූර හා ඒවායේ කාර්යයන් ඇතුළත් කරමින් ගොනුවක් සකස් කරන්න.

## ආහාර හා පාන වර්ග නිෂ්පාදන කර්මාන්තය

ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කෙරෙන සකස් කළ ආහාර හා පාන වර්ග, ආහාර හා පාන වර්ග නිෂ්පාදන කර්මාන්තයට අයත් වේ. මෙම කර්මාන්තයට යොමු වන ආයෝජකයන්ගේ සංඛ්‍යාව ඉතා ඉහළ මට්ටමක පවතින අතර මධ්‍යම, කුඩා හා ගෘහ කර්මාන්ත ලෙස විවිධ මට්ටමේ නිෂ්පාදන කර්මාන්ත රාශියක් දිවයින පුරා ව්‍යාප්ත ව ඇත. එවැනි ආයතන සංඛ්‍යාත්මක වශයෙන් ඉතා ශීඝ්‍රයෙන් ඉහළ යන බවක් හඳුනා ගත හැකි ය. එමෙන් ම ආහාර හා පාන වර්ග විශාල සංඛ්‍යාවක් ඇති බව ද වෙළෙඳපොළ පරීක්ෂා කිරීමේ දී පැහැදිලි වේ.

ශ්‍රී ලංකාවේ ශීඝ්‍රයෙන් වෙනස් වන සමාජ ආර්ථික රටාව තුළ පුද්ගලයන්ගේ අවිවේකී බව නිසා ඇසුරුම් කළ ආහාරපාන සඳහා ඇති ඉල්ලුම ක්‍රමික ව වර්ධනය වෙමින් පවතී. පාරිභෝගිකයන්ගේ ක්‍රයශක්තිය ඉහළ යාම ද මෙම භාණ්ඩ සඳහා ඇති ඉල්ලුම ඉහළ යාම කෙරෙහි බලපා ඇත. 2012 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ කාර්මික නිෂ්පාදන සංයුතියේ ආහාර හා පාන වර්ගවල දයකත්වය 31%ක් වීමෙන් මෙම කර්මාන්තයෙහි වැදගත්කම කැපී පෙනේ. (6.1 රූපය බලන්න). සැකසූ ආහාර අපනයනය කිරීමෙන් ද සැලකිය යුතු විදේශ විනිමයක් උපයා ගැනීමට හැකි වී තිබේ. 2011 වර්ෂයේ දී එමගින් උපයන ලද ආදයම ඇමරිකානු ඩොලර් දශලක්ෂ 94.88කි. (මූලාශ්‍රය - කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය, කාර්යය සමාලෝචනය, 2012)

### නිෂ්පාදන භාණ්ඩ

- සිසිල් බීම
- පලතුරු බීම
- රස කැවිලි
- බිස්කට්
- බේකරි නිෂ්පාදන
- කුළු බඩු වර්ග
- සකස් කළ ධාන්‍ය පිටි
- ක්ෂණික ආහාර
- මස්/මාළු (සකස් කළ)
- තේ වර්ග
- පොල් ආශ්‍රිත නිෂ්පාදන
- ශාක ආශ්‍රිත නිෂ්පාදන
- ජල බෝතල්
- කිරි ආශ්‍රිත නිෂ්පාදන

## ව්‍යාප්තිය

මධ්‍ය ප්‍රමාණයේ කර්මාන්ත වැඩි වශයෙන් මහ කොළඹ ආර්ථික කලාපය තුළ හා දිවයිනේ ප්‍රධාන නගර ආශ්‍රිත ව ව්‍යාප්ත වී ඇති අතර කුඩා හා ගෘහ පරිමාණ කර්මාන්ත දිවයිනේ සෑම ජනාධික ප්‍රදේශයක ම වාගේ ව්‍යාප්ත වී තිබේ.

## ගැටලු

- අමුද්‍රව්‍ය හා බලශක්ති මිල ඉහළ යාම නිසා නිෂ්පාදන වියදම් අධික වීම මත භාණ්ඩ මිල ඉහළ යාම.
- කෙටි කාලයක් තුළ අලෙවි කළ යුතු වීම නිසා ගබඩා කිරීම් හා අලෙවිය පිළිබඳ ගැටලු මතු වීම.
- බහු ජාතික සමාගම් ඇසුරෙන් කෙරෙන විවිධ ප්‍රචාරණ කටයුතු නිසා කුඩා පරිමාණ නිෂ්පාදනවලට සිදු වන බලපෑම
- විදේශ ආනයනික භාණ්ඩවලින් ඇති තරගය
- එක ම භාණ්ඩය විවිධ ආයතන මගින් විවිධ මාදිලියෙන් නිෂ්පාදනය කිරීම නිසා මතු වන අලෙවිය පිළිබඳ ගැටලු
- ආහාර කල්තබා ගැනීම හා රස ගැන්වීම සඳහා යොදන ලද අනුමත නොකරන ලද රසායනික ද්‍රව්‍ය නිසා ඇති විය හැකි සෞඛ්‍යමය ගැටලු
- ආහාරපානවල ප්‍රමිතිය පිළිබඳ ගැටලු

## ප්‍රවණතා

- සකස් කරන ලද ආහාරපාන වර්ග සඳහා දිනෙන් දින ඉල්ලුම ඉහළ යාම.
- කුඩා හා ගෘහ කර්මාන්ත වශයෙන් කෙරෙන නිෂ්පාදන වැඩි වීම.
- පාරිභෝගික ආකර්ෂණය ඇති වන පරිදි විවිධ අයුරින් ඇසුරුම් හා ප්‍රචාරණ ක්‍රම ක්‍රියාත්මක වීම.
- ආහාරපාන නිෂ්පාදන රැසක් අපනයනය සඳහා යොදගෙන තිබීම.

### පැවරුම

1. ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත ආහාර හා පාන වර්ග කිහිපයක ඇසුරුම්වල ඇති ලේබල් එකතු කර එම නිෂ්පාදන සිදු කළ ආයතන, පිහිටි ප්‍රදේශ, නිෂ්පාදිත දින, කල් ඉකුත්වීමේ දින ආදී තොරතුරු රැස් කර ගොනුවක් සකස් කරන්න. එමගින් ශ්‍රී ලංකා ආර්ථිකයට ලැබෙන දයකත්වය පිළිබඳ ව ඇගයීමක් කරන්න.

## ගෘහ කර්මාන්ත

සුළු ආයෝජනයක් සහිත, බොහෝ විට පවුලේ ශ්‍රමය මත යැපෙන, ව්‍යවසායකයාගේ නිවස තුළ හෝ ඒ ආසන්න ව පවත්වා ගෙන යනු ලබන කුඩා පරිමාණයේ කර්මාන්ත විශේෂයකි. ඇතැම් විට කුඩා අත් යන්ත්‍ර හා සරල විදුලිමය යන්ත්‍ර භාවිත කරන අතර බොහෝ විට සාම්ප්‍රදායික ශිල්ප ක්‍රම භාවිතය මෙම කර්මාන්තයේ කැපී පෙනෙන ලක්ෂණයකි. දේශීය කලා සම්ප්‍රදායන්, සංස්කෘතික උරුමයන් මෙම නිෂ්පාදන ඇසුරෙන් ආරක්ෂා වී තිබීම විශේෂත්වයකි.

## ගෘහ කර්මාන්ත කිහිපයක්

- අත් යන්ත්‍ර රෙදි විවීම. (Handloom textile weaving)
- බීරළු සහ කැටයම් කැපීම. (Ornamental bobbin and trelis work)
- වේවැල් භාණ්ඩ නිෂ්පාදනය (Cane products)
- ගෘහ භාණ්ඩ නිෂ්පාදනය (Production of household furniture)
- කොහු ආශ්‍රිත නිෂ්පාදන, බතික් රෙදි සකස් කිරීම. (Coir linked industries and Preparation of batik textiles)
- පැදුරු, පෙට්ටි, මලු නිෂ්පාදන (Production of bags, boxes, and mats)
- සකසන ලද ආහාර (රස කැවිලි/අතුරු ආහාර) (Sweetmeat and dessert preparations)
- විසිතුරු භාණ්ඩ / කලාත්මක භාණ්ඩ නිෂ්පාදනය (Ornamental and art products)
- මැටි භාණ්ඩ නිෂ්පාදන (Clay products)
- පිත්තල භාණ්ඩ නිෂ්පාදන (Brassware)



**6.9 රූපය**
**ගෘහ කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදන කිහිපයක්**

ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවල ගෘහ කර්මාන්ත ව්‍යාප්ත ව ඇති අතර ඇතැම් කර්මාන්ත විශේෂිත ප්‍රදේශවලට සීමා වී තිබේ. පිළිමතලාව පිත්තල කැටයම්, මොරටුව ලී බඩු, රදාවඩුන්න වේවැල් භාණ්ඩ, අම්බලන්ගොඩ වෙස්මුහුණු කර්මාන්තය, ගාල්ල, කොග්ගල බීරළු හා රේන්ද කර්මාන්ත නිදසුන් ලෙස දැක්විය හැකි ය.

## ගෘහ කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග

- දිවිනැගුම ජාතික සංවර්ධන වැඩසටහන
- කර්මාන්ත ගම්මාන ඇති කිරීම.
- හස්ත කර්මාන්ත සංවර්ධන වැඩසටහන
- ගෘහ කර්මාන්ත සඳහා ශ්‍රමිකයන් පුහුණු කිරීම.
- ප්‍රදර්ශන පැවැත්වීමෙන් නිෂ්පාදකයන් ධෛර්යමත් කිරීම.

## ගැටලු

- කාර්මික අමුද්‍රව්‍ය ලබාගැනීමේ ගැටලු
- පාරම්පරික ගෘහ කර්මාන්ත පවත්වා ගෙන යාම සඳහා ශ්‍රමය හිඟ වීම.
- මෙම නිෂ්පාදනවලට සමාන හා ආදේශන භාණ්ඩ ආනයනය මගින් ඇති වන බලපෑම
- නිෂ්පාදන වියදම් ඉහළ යාම.
- නිෂ්පාදන, අලෙවි කරගැනීම පිළිබඳ ගැටලු

## ප්‍රවණතා

- මෙම කර්මාන්ත නගා සිටුවීම සඳහා මධ්‍යම රජය මෙන් ම පළාත් හා ප්‍රාදේශීය මට්ටමෙන් ද විශාල අනුග්‍රහයක් ලබා දීම.
- සංචාරක කර්මාන්තය දියුණු වීමත් සමග මෙම කාර්මික නිෂ්පාදනවලට වැඩි ඉල්ලුමක් ඇති වීම.
- රාජ්‍ය අනුග්‍රහය මත වෙළෙඳපොළ සකස් කර දීම.
- මිනිස් ශ්‍රමය සමග නව තාක්ෂණික යන්ත්‍ර සූත්‍ර භාවිතය වැඩි වීම.

### ක්‍රියාකාරකම්

1. ඔබ ජීවත්වන ප්‍රදේශයේ කෙරෙන ගෘහ කර්මාන්ත කිහිපයක් නම් කරන්න.
2. ප්‍රදේශයේ දියුණුව සඳහා එම කර්මාන්ත මගින් සිදු වන මෙහෙය නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

පැවරුම්

1. ඔබ ප්‍රදේශයේ පවත්වා ගෙන යනු ලබන ගෘහ කර්මාන්ත තිබේදැයි සොයා බලන්න.
2. ඉන් එක් කර්මාන්තයක් තෝරාගෙන එම කර්මාන්තය සඳහා යෙදගන්නා අමුද්‍රව්‍ය, ශ්‍රමය හා වෙළෙඳපොළ, කර්මාන්තය ආශ්‍රිත ගැටලු හා ප්‍රවණතා ඇතුළත් වන පරිදි පොත් පිංචක් සකස් කරන්න.

## සංචාරක කර්මාන්තය

ශ්‍රී ලංකාවට සංචාරකයන්ගේ පැමිණීම පිළිබඳ දිගු ඉතිහාසයක් පවතී. විවිධ සංචාරකයින් විසින් ලියන ලද දේශාටන වාර්තාවලින් තහවුරු වන්නේ ශ්‍රී ලංකාව අතීතයේ සිට ම ආකර්ෂණීය රටක් ලෙස හඳුනාගෙන තිබූ බව යි.

ශ්‍රී ලංකාව, ඓතිහාසික උරුම (historical heritage), පාරිසරික උරුම (environmental heritage), නව නිර්මිත (innovations) වැනි ස්පර්ශ (tangible) උරුම මෙන් ම ආගන්තුක සත්කාර, කාරුණික බව වැනි අස්පර්ශ (intangible) උරුම රාශියක් අත්පත් කරගත් රටක් ලෙස ප්‍රසිද්ධ ය. ශ්‍රී ලංකා ආර්ථිකය තුළ සංචාරක කර්මාන්තයට වැදගත් තැනක් හිමි වී තිබේ.

මෑත කාලයේ දී ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයන්ගේ සංඛ්‍යාව, එමගින් ලබන ලද ආදායම හා සේවා නියුක්තිය පිළිබඳ තොරතුරු 6.7 වගුවෙන් දැක්වේ. එම අංශ තුනෙහි ම ශීඝ්‍ර වර්ධනයක් සිදු වී ඇති බව එම වගුවෙන් පැහැදිලි වේ.

**6.7 වගුව**

**2009 - 2012 දක්වා ශ්‍රී ලංකා ආර්ථිකය තුළ සංචාරක කර්මාන්තයේ වැදගත්කම**

| ශීර්ෂය | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|
| පැමිණි සංචාරකයන්ගේ සංඛ්‍යාව | 447 890 | 654 476 | 855 975 | 1 005 605 |
| දළ ආදායම (රු.මිලියන) | 40 133 | 65 018 | 91 926 | 132 427 |
| සේවා නියුක්තිය | 124 970 | 132 055 | 138 685 | 162 869 |


මූලාශ්‍රය : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
ශ්‍රී ලංකා මහ බැංකුව, 2012

### ව්‍යාප්තිය

ශ්‍රී ලංකාවේ සංචාරක ආකර්ෂණ (tourist attractions) සෑම ප්‍රදේශයක ම පාහේ දක්නට ඇතත් ශ්‍රී ලංකා සංචාරක අධිකාරිය (Tourist Authority) විසින් ප්‍රධාන සංචාරක කලාප (tourists zones) හතක් හඳුනාගෙන තිබේ.

## ප්‍රධාන සංචාරක කලාප

1. කොළඹ නගරය
2. මහ කොළඹ කලාපය
3. දකුණු වෙරළබඩ ප්‍රදේශය
4. නැගෙනහිර වෙරළබඩ ප්‍රදේශය
5. මධ්‍යම කඳුකරය
6. පුරාණ නගර අයත් කලාපය
7. උතුරු ප්‍රදේශය




6.2 සිතියම - සංචාරක කලාප

මූලාශ්‍රය - ***The National Atlas of Sri Lanka 2007,***
ඇසුරින් සකස් කරන ලදි.

### ගැටලු

- ධනවත් සංචාරකයන්ගේ පැමිණීම සීමා වීම.
- සංචාරකයන් වැඩි සංඛ්‍යාවකගේ පැමිණීම වර්ෂයේ එක් කාලයකට පමණක් සීමා වීම.
- සංචාරකයන්ට සපයන සේවාවන්හි ගුණාත්මක බව සෑම සංචාරක ප්‍රදේශයක ම එක හා සමාන ව පවත්වා ගෙන යාමට ඇති දුෂ්කරතා
- සංචාරක කර්මාන්තයට ප්‍රමාණවත් ලෙස යටිතල පහසුකම් සංවර්ධනය නො වීම.
- සංචාරක කර්මාන්තය මගින් සමාජ සංස්කෘතික පරිසරයට සිදු වන බලපෑම.
- ස්වාභාවික පරිසරයට සිදු වන අයහපත් බලපෑම.

### ප්‍රවණතා

- සංචාරක කර්මාන්තයෙහි වේගවත් දියුණුවක් ඇති වීම.
- සංචාරක පහසුකම් කඩිනමින් වැඩි දියුණු කිරීම.
- සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත ව ඍජු හා වක්‍ර රැකියා අවස්ථා වැඩි වීම.
- සංචාරක කර්මාන්තය සඳහා රාජ්‍ය හා පෞද්ගලික ආයෝජකයන්ගේ අනුග්‍රහය ලැබීම.
- සංචාරක හා ආගන්තුක සේවා කටයුතු සඳහා අවශ්‍ය විශේෂ පුහුණු ශ්‍රමිකයන් බිහිකිරීම සඳහා විශ්ව විද්‍යාල ඇතුළු ආයතන යොමු වීම.
- සාම්ප්‍රදයික සංචාරක ව්‍යාපාරය වෙනස් වෙමින් බහුවිධ අරමුණු පෙරදැරි ව කෙරෙන සංචාරක කටයුතුවල සිදු වන වර්ධනය (සංස්කෘතික, සංචාරක, පාරිසරික).

#### ක්‍රියාකාරකම්

1. 6.7 වගුව නිරීක්ෂණය කොට සංචාරකයන්ගේ පැමිණීම තීරු ප්‍රස්තාරයකින් දක්වන්න.
2. එම වගුවෙහි දත්ත ඇසුරෙන් සංචාරක කර්මාන්තයේ ප්‍රගතිය පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.
3. සංචාරක ව්‍යාපාරයෙන් ලැබිය හැකි ආර්ථික ප්‍රතිලාභ කිහිපයක් සඳහන් කරන්න.
4. සංචාරක ව්‍යාපාරයත් සමග ඇති විය හැකි සමාජ හා සංස්කෘතික ගැටලු කිහිපයක් පැහැදිලි කරන්න.

#### පැවරුම

ශ්‍රී ලංකාවේ ඔබ හඳුනාගත් සංචාරක ආකර්ෂණ ප්‍රදේශ, ඒවායේ පින්තූර සහ එක් එක් ස්ථාන පිළිබඳ කෙටි විස්තරයක් ඇතුළත් කරමින් ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයන්ට ඉදිරිපත් කිරීමට සුදුසු කුඩා පොත් පිංචක් සකස් කරන්න.

## ශ්‍රී ලංකා ආර්ථිකයේ කර්මාන්තවල වැදගත්කම

- ශ්‍රී ලංකා ආර්ථිකයට කර්මාන්ත අංශයෙන් ලැබෙන පිටිවහල පහත ක්ෂේත්‍ර ඔස්සේ හඳුනාගත හැකි ය.
    - දළ දේශීය නිෂ්පාදිතය (Gross National Product)
    - සේවා නියුක්තිය (Employment)
    - විදේශ විනිමය ඉපයීම (Foreign exchange earning)
- දළ දේශීය නිෂ්පාදිතයට කෘෂිකාර්මික, කාර්මික හා සේවා අංශයේ ඇති දයකත්වය සහ එක් එක් අංශවල සේවා නියුක්තිය 6.8 වගුවෙන් දැක්වේ. 2012 වර්ෂයේ දී දළ දේශීය නිෂ්පාදිතයට කාර්මික අංශයේ දයකත්වය 31.4%ක් වන විට එම අංශයෙහි සේවා නියුක්තිය මිලියන 2.1ක් වන බව ඉන් පැහැදිලි වේ. ඒ අනුව කාර්මික අංශයට දෙවන තැන හිමි වී තිබේ.

**6.8 වගුව**

**දළ දේශීය නිෂ්පාදිතයට ඇති දයකත්වය සහ සේවා නියුක්තිය - 2012**

| | ප්‍රතිශතයක් ලෙස | ශ්‍රමික පිරිස මිලියන |
|---|---|---|
| කෘෂිකාර්මික අංශය | 11.1% | 2.5 |
| කාර්මික අංශය | 31.4% | 2.1 |
| සේවා අංශය | 57.5% | 3.5 |

**මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව, 2012**


- විදේශ විනිමය ඉපැයීම අනුව ද කාර්මික අංශයේ දයකත්වය කැපී පෙනේ. සමස්ත අපනයන ඉපැයීම්වලින් 75.4%ක් කාර්මික භාණ්ඩ අපනයනයෙන් උපයාගෙන ඇති බව 6.9 වගුවෙහි ඇති තොරතුරුවලින් හෙළි වේ.

**6.9 වගුව**

**විදේශ විනිමය ඉපැයීම**

| | ඇමරිකන් ඩොලර් මිලියන | ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|
| කෘෂිකාර්මික අපනයන | 2231.5 | 23.9% |
| කාර්මික අපනයන | 7371.2 | 75.4% |
| ඛනිජ හා වෙනත් අපනයන | 70.9 | 0.7% |

**මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව, 2012**




**6.2 ප්‍රස්තාරය**

**භාණ්ඩ අනුව අපනයනය - 2012**

**මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව, 2012**

විදේශ විනිමය ඉපයීමේ දී කෘෂිකාර්මික, කාර්මික, ඛනිජ හා වෙනත් අපනයන මඟින් කරනු ලබන දායකත්වය ද කාර්මික අංශයෙහි එක් එක් නිෂ්පාදනවලින් ලබා දී ඇති දායකත්වය ද 6.2 ප්‍රස්තාරයෙන් දැක්වේ. ඒ අනුව විදේශ විනිමය ඉපයීමේ දී කාර්මික අංශය වැඩි දායකත්වයක් ලබා දී ඇති අතර රෙදිපිළි සහ ඇඟළුම් අපනයනයෙන් පමණක් 41%ක් උපයාගෙන ඇති බව ද එමගින් පැහැදිලි වේ.

**ක්‍රියාකාරකම**

"ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය කෙරෙහි කාර්මික අංශයේ ඇති වැදගත්කම" නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

## ආශ්‍රිත ග්‍රන්ථ සහ මූලාශ්‍ර


- Geological Survey and Mines Bureau, Sri Lanka Minerals Year Book - (2012)
- The National Atlas of Sri Lanka (2007)
- උපාලි වීරක්කොඩි (2009), මානුෂ භූගෝල විද්‍යාව දෙවන කොටස.
- කාර්ය සමාලෝචනය (2012), කර්මාන්ත හා වාණිජ කටයුතු අාමාත්‍යාංශය.
- මානුෂ භූගෝල විද්‍යාව, දෙවන කොටස (2009), අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.
- ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව (2012), ශ්‍රී ලංකා මහ බැංකුව.
- හේරත් ජේ. ඩබ්. (1979), ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත්, භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව.
- En - Wikipedia. org

## පාරිභාෂික වචන

| | | |
|---|---|---|
| • මිනිරන් | - Graphite | - காரியம் |
| • කාර්මික අමුද්‍රව්‍ය | - Industrial raw materials | - கைத்தொழில் மூலப்பொருள் |
| • පිඟන් මැටි | - China clay | - சீனக்களி |
| • වෙළෙඳ නාම | - Brand names | - வணிக உரிமைப்பெயர்கள் |
| • විසිතුරු භාණ්ඩ | - Ornaments | - அலங்காரப் பொருட்கள் |
| • විද්‍යුත් කර්මාන්තය | - Electronic Industry | - இலத்திரனியல் கைத்தொழில் |
| • අධි තාක්ෂණික කර්මාන්තය | - High-tech Industry | - உயர் தொழில்நுட்பக் கைத்தொழில் |
| • විද්‍යුත් උපකරණ | - Electronic equipment | - இலத்திரனியல் உபகரணம் |
| • විද්‍යුත් පරිපථ | - Electronic disks | - மின்சாரச் சுற்றுக்கள் |
| • දුරස්ථ පාලක | - Remote controls | - தொலைக்கட்டுப்பாடு |
| • සංඥා උපකරණ | - Signal equipment | - சமிக்ஞை உபகரணம் |
| • විද්‍යුත් සන්නායක | - Electronic sensors | - இலத்திரனியல் கடத்திகள் |
| • ආයෝජන ප්‍රවර්ධන කලාප | - Investment Promotion Zones | - முதலீட்டு ஊக்குவிப்பு வலயங்கள் |
| • පෙට්‍රෝ රසායන කර්මාන්තය | - Petro-Chemical Industry | - பெற்றொலிய இரசாயனக் கைத்தொழில் |
| • බොරතෙල් | - Crude oil | - மசகு எண்ணெய் |
| • ඛනිජ තෙල් | - Mineral oil | - கனிய எண்ணெய் |
| • පිරිපහදුව | - Refinery | - சுத்திகரிப்பு |
| • ක්‍රය ශක්තිය | - Purchasing power | - கொள்வனவுச் சக்தி |
| • විදේශ විනිමය | - Foreign exchange | - அந்நியச் செலாவணி |
| • ක්ෂණික ආහාර | - Instant food | - உடனடி உணவு |
| • බහු ජාතික සමාගම් | - Multi National Corporations | - பல்தேசியக் கம்பனிகள் |
| • සංචාරක කර්මාන්තය | - Tourist Industry | - சுற்றுலாக் கைத்தொழில் |
| • දළ දේශීය නිෂ්පාදිතය | - Gross Domestic Products | - மொத்த உள்நாட்டு உற்பத்திகள் |
| • සේවා නියුක්තිය | - Employment | - தொழில் வாய்ப்பு |